ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**යළි මුද්‍රණය කරන ලද ඓතිහාසික පාලි ව්‍යාකරණ ග්‍රන්ථයක් වන 'බාලාවතාරෝ' එළි දැක්වේ**

ඓතිහාසික පාලි ව්‍යාකරණ ග්‍රන්ථයක් වන 'බාලාවතාරෝ' කෘතිය කොළඹ, ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය සහ ඉන්දිය රජයේ සංස්කෘතික සබඳතා සඳහා ඉන්දිය කවුන්සිලයේ (ICCR) සහයෝගය ඇතිව පාත්ෆයින්ඩර් පදනම විසින් යළි මුද්‍රණය කරන ලද අතර එය 2025 සැප්තැම්බර් 13 වන දින නියෝජ්‍ය ඉන්දිය මහ කොමසාරිස් වෛද්‍ය සත්‍යාංජල් පාණ්ඩේ මහතා විසින් පාත්ෆයින්ඩර් පදනම හා එක්ව මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී එළි දක්වන ලදී. යළි මුද්‍රණය කරන ලද එම ග්‍රන්ථය මල්වතු පාර්ශ්වයේ අනුනායක අති පූජ්‍ය දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන හිමිපාණන් වහන්සේ, මල්වතු පාර්ශ්වයේ අනු නායක අති පූජ්‍ය ආචාර්ය නියංගොඩ විජිතසිරි හිමිපාණන් වහන්සේ, අස්ගිරි පාර්ශ්වයේ අනු නායක අති පූජ්‍ය වෙඩරුවේ ධර්මකීර්ති ශ්‍රී රතනපාල උපාලි හිමිපාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නය වෙත පිරිනමන ලදී.

2. 'බාලාවතාරෝ' කෘතිය කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගය ඇතිව පාත්ෆයින්ඩර් පදනම විසින් යළි මුද්‍රණය කරන ලද දෙවන පාලි ග්‍රන්ථය වන අතර මෙයට පෙර 'නාමමාලා' යන පාලි ව්‍යාකරණ ග්‍රන්ථය යළි මුද්‍රණය කරන ලදී. පරම්පරා ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ පිරිවෙන් සහ පාසල්වල පාලි අධ්‍යයනයේදී ඉමහත් සේ ප්‍රයෝජනවත් වී ඇති මෙම වටිනා ග්‍රන්ථය යළි මුද්‍රණය කිරීම හරහා එය ශ්‍රී ලංකාවේ පාලි භාෂාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සමීප කර ඇත. වැඩසටහන අතරතුරදී මහා සංඝරත්නය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා පාලි භාෂාව සම්භාව්‍ය භාෂාවක් ලෙස නම් කිරීම සහ පාලි භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා එතුමාගේ ප්‍රයත්නයන් අගය කළ අතර ඒ සම්බන්ධයෙන් ස්තුතිය පළ කළහ. පාලි භාෂාවේ බෙදා හදා ගන්නා උරුමය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දිගුකාලීන ආධ්‍යාත්මික සහ සංස්කෘතික බැඳීමේ ප්‍රබල සංකේතයක් වේ.

3. මෙම අවස්ථාව අමතමින් නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා ඉන්දියාව බෞද්ධ උරුමය සහ සංස්කෘතිය ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට කැප වී සිටින බව අවධාරණය කළේය. මාස කිහිපයකට පෙර බුදුන් වහන්සේගේ පූජනීය මැණික් ධාතුන් වහන්සේලා හොංකොං හිදී වෙන්දේසි කිරීමට නියමිතව තිබූ අතර එය කල් දමන ලද්දේ ඉන්දිය රජය විසින් මතු කළ විරෝධතා හේතුවෙනි. ඉන්දියානු රජය එම වෙන්දේසිය නැවැත්වීම සඳහා කඩිනම් සහ පුළුල් පියවර ගත් ආකාරය නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා විස්තර කළේය. ඉන්දියාව එම වෙන්දේසිය නීතිවිරෝධී බව අවධාරණය කරමින් 1898 වර්ෂයේදී පිප්රාහ්ව ප්‍රදේශයෙන් සොයා ගත් එම ධාතුන් වහන්සේලා නියමිත ස්ථානය වන ඉන්දියාවට වැඩම කරවිය යුතු බව ප්‍රකාශ කළ බව එතුමා සඳහන් කළේය. මෙම ධාතුන් වහන්සේලා දැන් ඉන්දියාවට වැඩම කරවා තිබෙන අතර ඒ හරහා ශ්‍රී ලංකාව ඇතුළු ලොව පුරා බෞද්ධ ජනතාවට එම ධාතුන් වහන්සේලා වැඳ පුදා ගැනීමට අවස්ථාව උදා වී ඇත.

***

**කොළඹ**
***2025* සැප්තැම්බර් *14***